# විද්‍යා

විද්‍යා දැනුම සොයන ඔබ වෙනුවෙන්

වර්ෂ 2023 ක් වූ අප්‍රේල් මස 28 වැනිදා සිකුරාදා




# අපේ පොළොව ලොකුවට හෙළ වෙන්නේ නෑ

# බය වෙන්න එපා...

හම්බන්තොට මුහුදු වෙරළට කිලෝමීටර 25.8ක් ඔබ්බෙන් වූ මුහුදු තීරයේ රික්ටර් මාපක 4.4ක සුළු භූ කම්පන තත්ත්වයක් පසුගිය 24 වැනි දින අලුයම 12.45ට පමණ ඇති වී තිබෙන බව ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පර්යේෂණ මහාචාර්ය දීපාල් සුබසිංහ මහතා "විද්‍යා" වෙත ප්‍රකාශ කර සිටියේ ය. මෙවැනි සුළු භූ කම්පන තත්ත්වයන් නිසා මින් කිසිදු අනතුරක් සිදු වී නොමැති බවත්, ජනතාව අනියත බියක් ඇති කර නොගත යුතු බවත් ඒ මහතා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ ය.

02 පිටුව...

## ශ්‍රී ලංකාවේ සර්පයෝ

04-05 පිටු...

## භූගත ජලය බොන්න හොඳද?

07 පිටුව...



01 වැනි පිටුවෙන්

# අපේ පොළොව හෙලවෙන්නේ නෑ....

## භූ තැටිය වෙනස් වෙලා

අතීතයේ පටන්ම අපි දන්න දෙයක් තමයි ශ්‍රී ලංකාව තිබෙන්නේ භූ තැටියක මැද කියන එක. භූ කෙළවර තිබෙන රටවලට තමයි ඇත්තටම ඔය භූ කම්පන බලපාන්නේ. මෑතකදී හොයාගත්ත දෙයක් තමයි ශ්‍රී ලංකාවට දකුණින් භූ තැටි මායිමක් නිර්මාණය වෙලා තිබෙනවා කියන එක. එම නිසා සුළු සුළු භූ කම්පන ශ්‍රී ලංකාවට දැනෙන්න පුළුවන්. ඇත්තටම මෙවැනි භූ විද්‍යාත්මක කර්තව්‍යයක් සිදු වෙන්න සාමාන්‍යයෙන් අවුරුදු මිලියන ගණනක් ගත වෙනවා. නමුත් අපි මෙය සොයා ගත්තේ ඉතාම මෑත කාලයේ.

භූ කම්පනයක් සිදු වන්නේ භූ තැටියක් තවත් භූ තැටියක ගැටෙන විට හෝ එකිනෙකට ඈත් වීමක් සිදු වන විට හෝ ඒවා එකිනෙක ඇතිල්ලීගෙන ගමන් කරන විට යි.







This shows the developing of the split (within the Indo-Australian plate)

කෙසේ නමුත් තවමත් අපිට කියන්න පුළුවන් හිමාල ප්‍රදේශයේ, පිලිපීනයේ, ජපානයේ, නවසීලන්තයේ වගේ රටවල ඇතිවන විශාල භූ චලන ශ්‍රී ලංකාවේ ඇති වෙන්නේ නෑ. කොහොම වුණත් අපි ඉන්නේ භූ තැටියක මැද කොටසේ. ඒ නිසා අපිට වන බලපෑම ඉතා ම අඩුයි.




**Note:** The dashed zone to the south of Sri Lanka is a broad diffused boundary between Indian and Australian Plates




**Figure 1**: New Plate Boundary near Sri Lanka
*Picture Courtesy: U.S. Geological Survey*

නමුත් මෙවැනි කුඩා කුඩා භූ කම්පන ඉදිරියටත් සිදු වෙන්න පුළුවන්. කොහොම වුණත් මින් හානියක් වීමට ඇති සම්භාවිතාව ඉතා ම අඩුයි. ඇත්තටම, එක්දස් හයසීය ගණන්වල ඒ කියන්නේ, පෘතුග්‍රීසින් ඉන්න කාලේ තමයි අන්තිමට කොළඹට දැනෙන ලෙස භූ කම්පනයක් සිදු වී තිබෙන්නේ.

## සන්නිවේදනයේ දියුණුව

සන්නිවේදනයේ දියුණුව නිසා වර්තමානය වන විට මාධ්‍ය හා සමාජ මාධ්‍ය නිසා රටේ කුමන හෝ ප්‍රදේශයක ඇති වන භූ කම්පන තත්ත්වයක් ඉතා ඉක්මනින් බොහෝ පිරිසක් දැන ගන්නවා. ඇත්තටම අතීතයේත් මේ වගේ සුළු සුළු භූ කම්පන ඇතිවෙලා තිබෙනවා. නමුත් වර්තමානය තරම් සන්නිවේදනය දියුණු නොවුණ නිසා ඒවාට කිසිම ප්‍රචාරයක් ලැබුණේ නෑ.




## මේ විදියට පරිස්සම් වෙන්න

හොඳම දේ තමයි විශාල ගොඩනැගිල්ලක් තුළ ඉන්නවා නම් හැකිනම් ඉන් පිටත එන්න. එහෙම ඉන්නවා නම් ශක්තිමත් මේසයක් යටට යන්න. බිත්ති ගාව වැතිරෙන්න එපා. ඇත්තටම ශ්‍රී ලංකාව වගේ රටකට මෙහෙම කරන්න උවමනාවක් වෙන්නේ නෑ. මොකද එවැනි විශාල භූ චලන ශ්‍රී ලංකාවට ඇති වෙන්න තියෙන ප්‍රවණතාව ඉතා අඩුයි. ඇත්තට ම රික්ටර් මාපක 4ක් වගේ භූ කම්පන අගයකින් විශාල ගොඩනැගිලි කඩා වැටෙන්නේ නෑ.

## තාක්ෂණය තවම දුර්වලයි

ඇත්තටම භූ චලනයක පෙර දැනුම්දීම් සිදු කරන්න තරම් ලෝකයේ තාක්ෂණය තවම දියුණු වෙලා නෑ. තාක්ෂණය අතින් බොහෝ දියුණු රටක වුණත් භූ චලන වැඩියෙන් ම සිදු වන රටක් වුණත් විනාඩියකට කලින් හෝ දැන ගන්න පුළුවන් වුණත් පැයකට පෙරවත් දැනුම් දීමේ තාක්ෂණයක් තවම නෑ.




පර්යේෂණ මහාචාර්ය දීපාල් සුබසිංහ
ජාතික මූලික අධ්‍යයන ආයතනය